**ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුවේ 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිසා ගිණුම් කාර්යාල 03 ක කේවල ණය ශේෂ එකතුව පාලන ගිණුම්වල ශේෂයට සමාන නොවූ අතර එම රු. 2,111,326 ක සෘණ ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | මහනුවර, නාරාහේන්පිට දිසා ගිණුම් කාර්යාලවල වෙනස හඳුනාගෙන ඇති අතර එය 2023 වර්ෂයේදී නිවැරදි කරන අතර අනුරාධපුරය, කළුතර සහ කොළඹ දකුණ දිසා ගිණුම් කාර්යාලවලවෙනස්කම් සම්බන්ධව පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට අවශ්‍යකටයුතු කරන බව දන්වා සිටිමි. | වෙනස හඳුනාගෙන නිවැරදි කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මු.රෙ. 85(1) සහ මු.රෙ.85(2) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ආදායම් කාණ්ඩ 31 ක හිතකර විචලතාව රු. 109,140 සිට රු. 214,474,405 ක් දක්වා වූ පරාසයක පැවති අතර ආදායම් කාණ්ඩ 17 ක අහිතකර විචලතාවය රු. 150,636 සිට රු. 399,601,545 ක් දක්වා පරාසයක පැවතුණි. | තැපැල් ගාස්තු සංශෝධනය, රටේ පැවති උද්ධමනකාරී තත්වය, විදේශ විනිමය අනුපාතිකයේ වැඩිවීම,2022 වර්ෂයේ සිදු වූ විදුලි ගාස්තු වැඩි කිරීමට සාපේක්ෂව සේවා ගාස්තු වැඩි වීම, පාරිභෝගික විශ්වාසය වර්ධනය වීම හිතකර විචලතාවයට හේතු ලෙස දක්වා තිබුණි.<br>කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සේවා ලබා ගත් සමහර ආයතන වසා දැමීම, කඩදාසි හිඟ වීමත් සමහවිකල්ප මාධ්‍ය භාවිතා කරමින් ආයතන තම සේවා කටයුතු සිදු කිරීම අහිතකර විචලතාවයට හේතු ලෙස දක්වා තිබුණි. | ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයේ තත්‍ය ආදායම සැසඳීමේදී ආදායම් කාණ්ඩ 06 ක් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 35 ට වැඩි ප්‍රතිශතයකින් අඩුවී තිබුණි. | විදේශ පාර්සල් ආපසු යැවීම අඩුවීම, විභාග දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් අත්සන් කිරීම කඩිනම් නොවීම නිසා එම ආදායම වර්ෂය තුල ලබා ගැනීමට නොහැකි වීම, තොරතුරු තාක්ෂණ පද්ධතියේ සිදුකල සංවර්ධන කටයුත්තක් හේතුවෙන් 2020 වර්ෂයට අදාළරු.10,537,178ක ආදායම 2021 වර්ෂයේ ආදායම තුළ අන්තර්ගත වීම,Business Reply Coupon ආදායම සංචාරක පැමිණීම අඩු වීම හේතුවෙන් අඩුවීම, Hybrid Tele Mail භාවිතය අඩුවීම, වෙනත් විකල්ප සඳහා පාරිභෝගික යොමුවීම සහ තැපැල් කවුළු මගින් රක්ෂණ ගණුදෙනු සිදු වී නොමැති බැවින් සේවා ගාස්තු ආදායම අඩු වීම සහ සංචරණ සීමා ඉවත් කිරීමෙන්තැපැලෙන් ඖෂධ ලබාගැනීම් සේවාව භාවිතා කිරීම අඩුවීම ආදායම අඩුවීමට හේතු ලෙස දක්වා තිබුණි. | ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ආදායම් ශේෂය රු. 93,411,706 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. ඉන් රු. 75,243,443 ක් 2019 වර්ෂයේ හා ඊට පෙර වර්ෂයන් තුළ සිට පැවත එන හිඟ මුදල් වන අතර ඒ සඳහා කාල විශ්ලේෂණයක්ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අධිවේගී තැපැල් පහසුකම යටතේ හිඟ ආදායම ක්‍රමිකව බැංකු තැන්පතු හා ඇපකර මගින් අය කිරීම, නිදහස් තැපැල් පහසුකම යටතේ සේවා ලබාගත් රාජ්‍යආයතන වෙත සිහි කැඳවීම් ඉදිරිපත් කිරීම මගින් අය කිරීමට කටයුතු කරනු ලබයි. 2019 දෙසැම්බර් 31දින දක්වා සමුච්චිත හිඟමුදල ඊට පෙර වර්ෂ කිහිපයක හිඟශේෂයන් එකතු වීමෙන් ජාත්‍යන්තර තැපැල් හිඟ ආදායම සමන්විත වේ. වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී එම හිඟ ශේෂයන් ඉදිරියට ගෙන යන අතර මෙම ගිණුම් කටයුතු පරිගණකගත හෝ වෙනත් system එකක් මගින්ක්‍රියාත්මක නොවන බැවින් 2022 වසරේ සිට ගිණුම් කටයුතු ජාත්‍යන්තර ගිණුම් අංශය විසින් සකස් කරගත් පරිගණකගත excel sheet මෘදුකාංගය තුළ ඇතුළත් කරන බැවින් 2023 වසරේ සිට ඉදිරියට කාල විශේලේෂණ වාර්තාවක් ලබා දීමට කටයුතු කරනබව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු අතර කාල විශ්ලේෂණයක් සකස්කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් විදේශ තැපැල් පරිපාලන ආයතන වෙත2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර තිබුණු නමුත් එම ආයතන විසින් හිඟ ආදායම් වාර්තා අනුමත කර නොතිබීම හේතුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 09 ක් දක්වාකාල පරාසයක විහිදී තිබුණු හිඟ ආදායම රු. 485,956,641 ක් විය. එම හිඟ මුදල අය කරගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් බලපෑමක් සහ හිඟ ආදායම අනුමත නොකිරීමට හේතු සොයා බැලීමක්ද සිදුකර නොතිබුණි. | විදේශ තැපැල් පරිපාලන ආයතන වෙත ගිණුම්ඉදිරිපත් කර මාස 02ක් ඇතුළත එම ගිණුම් අනුමතකර හෝ සංශෝධනයකර හෝ ප්‍රතික්ෂේප කර එවීම කළයුතු වුවද ඇතැම් තැපැල් පරිපාලන ආයතන වෙත නිසි කාලය තුළ සිහිකැඳවීම් කළද එලෙස අනුමත නොකළ ආදායම් ශේෂ පවතී. | විදේශ තැපැල්පරිපාලන ආයතන ආදායම අනුමත නොකිරීමට හේතු සොයාගත යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 07 ක හා මූලධන වැය විෂයයන් 07 ක එකතුව රු. 254,420,910 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 14 සිට සියයට 99 ක පරාසයක් දක්වා විහිදී තිබුණි. | ගමන් වියදම් සීමා වීම, සැපයුම්කරුවන් විසින් නිළ ඇඳුම් සැපයීම සිදු නොකිරීම, සේවා ගිවිසුම් වර්ෂය අවසාන වන තෙක් ඉදිරිපත් නොකිරීම, වියදම් පාලනය කිරීම, රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත වාහන මිලදී ගැනීම සිදු නොකිරීම හා දේපළ ණය ලබාදීම බැංකු මගින් අත්හිටුවීම, මූලධන වියදම් දැරීම දැඩිව සීමා කිරීම, ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමුවද රටේ පැවති ආර්ථික අර්බුදය, අමුද්‍රව්‍ය හිඟතාවය හා කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව ප්‍රතික්ෂේප කිරීම, සැපයුම්කරු වෙත ප්‍රතිග්‍රාහක ලිපිය නිකුත් කළද 2022 වර්ෂය අවසාන වන තෙක් ඔවුන් ගිවිසුම් අත්සන් කිරීමට නොපැමිණීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු ලෙස දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් කරන ලද වැය විෂයයන් 02 ක රු.21,617,958 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | සැපයුම්කරුවන් විසින් නිළ ඇඳුම් සැපයීම සිදු නොකිරීම, සේවා ගිවිසුම් වර්ෂය අවසාන වන තෙක් ඉදිරිපත් නොකිරීම ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු ලෙස දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීමේදී හැකිතාක් නිවැරදිව අවශ්‍යතාවය හඳුනාගත යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු. 16,035,709 ක බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගෙන නොතිබුණි. | අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොමැත. | සියලු බැරකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | දිසා ගිණුම් කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව 2022 දෙසැම්බර් 31 දිනට රු. 250,276 ක බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගෙවීමට නොහැකි වූ වවුචර් අතපසුවීමකින් cigas වැඩසටහනෙහි බැරකම් ලෙස ඇතුළත් කිරීමට නොහැකි වී ඇති අතර, ඉදිරියේදී නිවැරදිව කටයුතු සිදු කරන ලෙස අදාළ නිළධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | සියලු බැරකම් නිවැරදිව හඳුනාගත යුතුය. |

## 2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍යපාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිටපතක් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4 සහ 4.5 වගන්ති | | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ තහනම් කළ, විශ්‍රාම ගිය, සේවය හැර ගිය, මිය ගිය සහ වෙනත් සේවකයන් 935 කගෙන් අයවිය යුතු ණය ශේෂය වර්ෂ 05 ට වැඩි රු. 21,117,666 ක්ද ඇතුළුව රු.52,265,482 ක් වුවද ආයතන සංග්‍රහය පරිදි කටයුතු කර නොතිබුණි. | මේ වන විට එම ණය ශේෂයන් අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.2.5, 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1938 අංක 01 දරන තැපැල් කාර්යාල ඇප අරමුදල් ආඥා පනතේ 1978 සංශෝධනයට අනුව ආඥා පනතේ 6(1) සහ 6(2) වගන්ති | 144,334 | පනතට පටහැනිව අවස්ථා කිහිපයකදී රු. 144,334 ක මුදලක් ගෙවා තිබුණි. | යෝජිත ඇප ආඥා පනත සංශෝධන කටයුතු වලදී මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් ඇතුළත් කර පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු යොදන බවත් දුරකථන වැය සීමාව ඉක්මවා තිබූ මුදල තැපැල්පති අනුමැතිය සහිතව ඇප අරමුදලින් පියවූ බවත්, අරමුදලේ පාලක මණ්ඩලයේ අනුමැතිය පරිදි කොන්ත්‍රාත් පදනම මත නිළධාරීන් දෙදෙනෙකු සේවයේ යෙදවූ බවත් කාරුණිකව දන්වා සිටිමි. | පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය |

## 2.6 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුවට සෘජුව බැරකරන ලද ලැබීම් රු. 5,651,599 ක් අදාළ ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් හඳුනා ගත් වහාම අදාළ ආදායම් ශීර්ෂයන් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘතීන් 10 ක් 2022 වර්ෂය තුළදී සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් අදහස් දක්වා ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මඩකලපුව තැපැල් සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදනය ලෙස රු. මිලියන 100 ක් වෙන්කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 90 ක්ද, මූල්‍ය ප්‍රගතිය සියයට 99.31 ක් ලෙස දක්වා තිබුණු නමුත් ව්‍යාපෘතියට අයත් කාර්යයන් 09 ක් නිමකර නොතිබුණි. | රට තුල උද්ගතවූ කොවිඩ් වසංගතය හමුවේ හා රට තුල පවතින ආර්ථික අර්බුදකාරී වාතාවරණය හමුවේ මිලදී ගැනීම් ප්‍රමාදවීමත්, සිමෙන්ති වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීමත්, විදේශ විනිමය ඉහල යාම හේතුවෙන් අදාළ කාලය තුළ ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වී ඇත. අමතර ඇස්තමේන්තුවක් සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මඩකලපුව තැපැල් සංකීර්ණය ඉදිකිරීම සඳහා එකතු කළ අගය මත බදු සහිතව රු. 343,739,916 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණු අතර එම ඉදිකිරීම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | | |

| | | | |
|---|---|---|---|
| | මගින් සිදුකර ගැනීමට 2019 මැයි 08 දින ගිවිසුමකට එළඹ තිබුණි.මෙම ඉදිකිරීම් පිළිබඳ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | මෙම ඉදිකිරීමේ උපදේශන සේවා ගාස්තු සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන වෙන් කරගෙන නොතිබුණු අතර ඉදිකිරීම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන තුළින් උපදේශන ගාස්තු රු. 8,079,172 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණි. | මඩකලපුව තැපැල් සංකීර්ණය ඉදිකිරීමට අදාළව උපදේශන ගාස්තුව කලින් වෙන්කර ගැනීමක් සිදුකර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් අදාළ වැය සඳහා ප්‍රතිපාදන වෙන් කරගත යුතුය. |
| (ii) | කොන්ත්‍රාත් ගිවිසුමේ 8.2 ප්‍රකාරව මෙම ඉදිකිරීම 2021 මාර්තු 12 දිනෙන් අවසන් කිරීමට නියමිතව තිබුණද අවස්ථා 03 කදී දින දීර්ඝ කිරීම් සිදුකර තිබුණි. ඒ අනුව මෙම කොන්ත්‍රාත්තුව 2022 දෙසැම්බර් 19 දින වන විට සම්පූර්ණ කළ යුතුව තිබුණද 2023 පෙබරවාරි 15 දින දක්වා අවසන් කර නොතිබුණු අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක්ද සිදුකර නොතිබුණි. | රට තුල උද්ගතවූ කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රට වසා තිබූ පසුබිමක ඉදිකිරීම් අඛණ්ඩව සිදුකිරීමට නොහැකි වීම, පොලිස් ඇඳිරි නීතිය, රට තුල පවතින ආර්ථික අර්බුදකාරී වාතාවරණය හමුවේ මිලදී ගැනීම් ප්‍රමාදවීමත්, සිමෙන්ති වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම, විදේශ විනිමය ඉහල යාම හා ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල අධික ලෙස ඉහල යාම ඇස්තමේන්තුගත පිරිවැයට අදාළ කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට නොහැකි වී තිබුණි. | කොන්ත්‍රාත්තුව නියමිත දිනවල අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් ව්‍යාපෘතිය සඳහා රු. 216,577,994 ක අමතර ඇස්තමේන්තුවක් යටතේ ඉදිකිරීම් කටයුතු නිම කරවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගැනීම සඳහා 2023 ජනවාරි 13 දින ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවත් 2023 පෙබරවාරි 15 දින දක්වා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පතක් 2023 ජනවාරි 12 දිනැතිව ඉදිරිපත් කරන ලද නමුත් මෙතෙක් අනුමැතිය ලැබී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | හැකි අයුරින් පසු විපරම් කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් දෙපාර්තමේන්තුව වෙනුවෙන් එකක් රු. 615,915 බැගින් තැපැල් මුද්‍රණ යන්ත්‍ර 60 ක් රු. 36,954,900 කට මිලදීගැනීම පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | 2021 නොවැම්බර් 05 දින ලංසු කැඳවීම සඳහා සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට අයත් දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල දැන්වීම් පලකර තිබුණු අතර දිනමිණ පුවත්පතේ පලකර තිබුණු දැන්වීමේ යෝග්‍යතා උපමානයන් යටතේ වූ 3(ආ) කරුණ ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත්වල කර තිබුණු 3(ආ) කරුණට වඩා වෙනස්ව පලකර තිබුණි. | ප්‍රසම්පාදන අංශය විසින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරන ලද ලංසු ආරාධනා පත්‍රය සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම වෙත යොමු කරනු ලබන අතර, එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් එම ලංසු ආරාධනා පත්‍රය සිංහල හා දමිළ මාධ්‍යයට පරිවර්තනය කර දැන්වීම් පල කළ බව දන්වා සිටිමි. | සුපරීක්ෂණය වැඩි කළ යුතුය. |
| (ii) | යන්ත්‍ර සැපයීමට අදාළ කාලය වූ 2022 ජනවාරි 31 දින සිට දින 60 ක් දක්වා වූ කාලය දින 90 ක් දක්වා දීර්ඝ කිරීමට 2021 නොවැම්බර් 23 දින පැවති ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණද 2023 පෙබරවාරි 15 දින දක්වා වර්ෂ 01 කට වැඩි කාලයක් ගතවී තිබුණද අදාළ සැපයුම්කරු විසින් තැපැල් මුද්‍රා යන්ත්‍ර 10 ක් පමණක් දෙපාර්තමේන්තුවට සපයා තිබුණි. ඉතිරි යන්ත්‍ර 2023 අප්‍රේල් දක්වාම ලැබී නොතිබුණි. | ඉතිරි තැපැල් මුද්‍රා යන්ත්‍ර 50 සපයා ගැනීම සම්බන්ධව දෙපාර්ශවය විසින් එකඟ වන ලද ගිවිසුමේ සඳහන් මිල ගණන් අනුව සැපයීම සිදු කරන ලෙසටත්, ඒ සඳහා අදාළ ආයතනය එකඟ නොවන්නේ නම්, කාර්යසාධන බැඳුම්කරය නිදහස් නොකිරීමටත් තීරණය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | රජයට අලාභයක් නොවන පරිදි අවශ්‍යතාවයන් සපුරා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ගැනුම් ඇණවුම අනුව 2022 මාර්තු 01 දින වන විට පුද්ගලයන් 60 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකට පුහුණු වැඩසටහන් සිදුකරන බව දක්වා තිබුණද විගණිත දින වූ 2023 පෙබරවාරි 15 දින වන විටත් එවැනි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | මෙතෙක් පුහුණු වැඩසටහනක් පවත්වා නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | අවශ්‍යතාවය පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ජාතික තරඟකාරී මිල ක්‍රමයට ඩෙස්ක්ටොප් පරිගණක 450 ක්ද, UPS 450 ක් සහ ලැප්ටොප් පරිගණක 08 ක්මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 18 දින රු. 151,632 ක වියදමක් දරා පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. එම දැන්වීම සහ වෙනත් ප්‍රසම්පාදනයට අදාළ දැන්වීමක් සදොස්ව සිදු කිරීම හේතුවෙන් එම දැන්වීම්වල තිබුණු "ජාත්‍යන්තරව පිළිගන්නා" යන්න ඉවත් කිරීම සඳහා නැවත පුවත්පත් දැන්වීමක් පල කිරීම හේතුවෙන් රු. 59,413 ක් අමතරව වැය කර තිබුණි. ලංසු ලියකියවිලි ඉදිරිපත් කිරීමේදී ආයතන 02 ක් එම ආයතන 02 අතරඅන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුමක් ඇති බවට ලිපියක් ඉදිරිපත් කර තිබුණි. ඒ පිළිබඳව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙතින් විමසා තිබුණද එම දෙපාර්තමේන්තුව විසින් ඒ පිළිබඳව එවූ ලිපිය ලිපිගොනුවේ නොතිබුණි. එම ලිපිය පදනම් කර ගනිමින් එම ආයතනවල ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් එවූ ලිපිය ලිපිගොනුවේ නොතිබීම හේතුවෙන් ඒ පිළිබඳව විගණනය කිරීමට නොහැකි විය. | ප්‍රසම්පාදන දැන්වීම අනුව සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී ප්‍රායෝගිකව සිදුවන අපහසුතාවය මගහරවා ගැනීමට නැවත සංශෝධිත ප්‍රසම්පාදන දැන්වීමක් පළකල බව දන්වා සිටිමි.<br>රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් වෙතින් විමසීම් සිදුකර ඇතත්, එම ලිපියට පිළිතුරු නොලැබුණු බැවින් එම දෙපාර්තමේන්තුවෙන් වාචිකව උපදෙස් ලබාගත් අතර ඒ අනුව ලංසු ඇගයීම් නිර්ණායක වල ගිවිසුම්ගත ආයතන ඇගයීමට ලක්නොකල බව කාරුණිකව දන්වමි. | සියලු අවශ්‍යතා ඉටු වන පරිදි පුවත්පත් දැන්වීම් පල කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානය වන විට විධිමත්ව පවරා නොගත් තැපැල් කාර්යාල 565 ක් වූ අතර තැපැල් දෙපාර්තමේන්තුව සතුව ඉඩම් තිබියදී කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීමට කටයුතු නොකර තැපැල් කාර්යාල 08 ක් කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන ගොස් තිබුණි. | ඉඩම් පැවරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා මේ වනවිටත් සියළුම නියෝජ්‍ය තැපැල්පති කොට්ඨාශ ආවරණය වන පරිදි, අදාළ ආයතන සඳහා ඉඩම් පවරාදීමේ කටයුතු කඩිනමින් සිදුකර දෙන ලෙස ඉල්ලීම් ලිපි යොමුකර ඇති බව දන්වා සිටිමි. ඉඩම් පවරා ගන්නා ලද නමුත් එම ඉඩම්වල නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් දෙපාර්තමේන්තුව වෙත ලබාදී නොමැති බැවින් එම ඉඩම් ඌණ උපයෝජිතව පවතින බව සඳහන් කරමි. එම නිසා එම කාර්යාල කුලී පදනම මත ගොඩනැගිලි වල ස්ථාපනය කර පවත්වාගෙන යාමට සිදුව ඇති බව වාර්තා කරමි. | තැපැල් කාර්යාල 565 විධිමත්ව පවරාගත යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු තැපැල් කාර්යාල 43 ක හා නිල නිවාස 02 ක වර්ග මීටර 83,152.61 (පර්චස් 3,286.66) ක ඌන උපයෝජිත ඉඩම් පවතින බව නිරීක්ෂණය විය. | රට දැඩි මූල්‍ය අර්බුදයකට මුහුණ පා සිටින වකවානුවක, තැපැල් දෙපාර්තමේන්තුවට විධිමත්ව පවරන ලද ඉඩම් වල නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රාජ්‍ය මුදල් සෘජුවම ආයෝජනය කිරීමට හැකියාවක් නොපවතින බැවින් තැපැල් දෙපාර්තමේන්තුවේ අයිතිය සුරක්ෂිත වන ආකාරයේ ක්‍රමවේදයක් අනුගමනය කරමින් නව ගොඩනැගිලි ඉදිකිරීමට ඌණ උපයෝජිත ඉඩම් කොටස් 17 ක් යෝජනා කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමුකර ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.ඉඩම් බොහෝමයක තැපැල් කාර්යාල පවතින නමුත් එම ඉඩම් වල වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති සිදුකිරීමට හැකියාවක් පවතින බව සඳහන් කරමි. | ඌන උපයෝජිත ඉඩම් වෙනුවෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් පවරාගෙන ඇති නමුත් තක්සේරු කර නොමැති ඉඩම් ප්‍රමාණය 63 ක් විය. එලෙස පවරාගෙන තක්සේරු කර නොමැති වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ඉඩම් ප්‍රමාණය 30 ක් විය. | ලිපි ලේඛන බොහොමයක් තැපැල් මූලස්ථානයේ ගොඩනැගිලි අංශයේ මෙන්ම, ප්‍රාදේශීය තැපැල් අධිකාරී කාර්යාල වලද නොමැති වීම හේතුවෙන් මෙතෙක් තක්සේරුව සඳහා යොමු කල නොහැකි වී ඇත. | තැපැල් දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් නිසි පරිදි හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවරාගෙන තක්සේරු කර නොමැති වර්ෂ 10 ත් වර්ෂ 35 ත් අතර කාල පරාසයක් තුළ පවරාගත් ඉඩම් 15 ක් සහ පවරාගෙන තක්සේරු කර නොමැති වර්ෂ 02 ක අඩු කාලයක සිට පැවත එන ඉඩම් 30 ක් විය. ඉඩම් 03 ක පවරාගත් දිනය කවදාද යන්න දෙපාර්තමේන්තුවට සොයාගත නොහැකි වී තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ තැපැල් හා උප තැපැල් කාර්යාල 12 ක ඉඩම් පවරාගැනීම් හා මැනීම් කටයුතු සඳහා රු. 371,940 ක් වැයකර තිබුණු නමුත් 2023 මාර්තු 28 දින දක්වා එම ඉඩම් පවරාගැනිමේ කටයුතු අවසන් වි නොතිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රමවේදය යටතේඉඩමක් මැනුම් කිරීමෙන් පසුඑහි පිඹුර ඉඩම් කොමසාරිස් ජනාරාල් වෙත ඉදිරිපත් කිරීමේ කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් සිදුකරනු ලබන අතර එම ආයතන වල පවතින කාර්යක්ෂමතාවය හා නෛතික තත්වයන් මත විධිමත්ව පැවරීම් කටයුතු සඳහා යම් කාලයක් ගතවන බව වාර්තා කරමි. | තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල 12 ක ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු අවසන් කළ යුතුය. |
| (ඉ) | ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා හා නියෝජ්‍ය තැපැල්පති කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව තැපැල් කාර්යාල ඉඩම්වල අයිතියේ වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය. | තැපැල් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල ඉඩම් විධිමත්ව ලෙස පැවරීමෙන් පසු ලබාදෙන ලද සහතික පත්‍ර හා ඉඩම් අත්පත් පනත යටතේ භුක්තිය ලෙස ලබාදී ඇති ලිපි ලේඛන ඇතුලත් ගොනු, ගොඩනැගිලි හා ඉඩම් අංශයේ පවතියි. තවද, එම විධිමත්ව පවරන ලද කාර්යාල වල විධිමත් පැවරීම් සහතික වල මුල්පිටපත් තැපැල් මූලස්ථානය වෙත ගෙන්වා ගෙන ඇත | දත්ත පද්ධතිය නිවැරදිව සකස් කළ යුතුය. |
| (ඊ) | තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන් හා මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී වාහන 42ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතරඅංක 60 ශ්‍රී 7256 දරන බස්රථය භාවිතයෙන් ඉවත්කර තිබුණද ඒසඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. | තැපැල්පති නමින් ලියාපදිංචි කර වාහන 42 සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එමකමිටුව මගින් ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. 60 ශ්‍රී 7256 අංක දරන බස් රථය මුද්දර කාර්යාංශයේ ප්‍රදර්ශන රථයක් ලෙස යොදා ගැනීම සඳහා අළුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | තැපැල්පති නමින් ලියාපදිංචිව ඇති සියලුම වාහන හඳුනාගත යුතුය. භාවිතයෙන් ඉවත් කර තිබුණු බස් රථය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 5-10 ත් අතර කාලයට අයත් රු. 578,171 ක සහ වර්ෂ 10 ට වැඩි කාලයකට අයත්රු. 14,671,180 ක අලාභ හානිවල එකතු වටිනාකම වූරු. 15,249,351 ක අලාභය තවදුරටත් අය කරගැනීමට දෙපාර්තමේන්තුව විසින් අපොහොසත් වී තිබුණි. | මුදල් වංචා, සොරුබිදීම්, මංකොල්ලකෑම් ආදිය සම්බන්ධව පොලිස් වාර්තා, විමර්ශන පරීක්ෂණ වාර්තා ආදිය සපයා ගැනීමට ඇති අපහසුතාවය (ඇතැම් අලාභයන් වර්ෂ 10කට වැඩිවීම හේතුවෙන් ත්‍රස්ත්‍රවාදි ක්‍රියා,හමුදා මෙහෙයුම් වැනි කරුණු මත අවශ්‍ය තොරතුරු අස්ථාන ගතවීම) නඩු පැවතීම් ආදි කරුණු හේතුවෙන් අලාභය කපාහැරීමට ප්‍රමාද වීමට හේතුවක් වී ඇතිබව දන්වා සිටිමි. | අලාභ අය කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.6 කළමනාකරණ දූර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ 09 කට පෙර රු. 1,295,400 ක වටිනාකමැති මූල්‍ය වංචාවක් අනාවරණය වී තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු. 1,145,850 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එයට අදාළ විමර්ශනයක් මේ වන විට සිදු කරමින් පවතියි. | දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු අවසන් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය තැපැල්පති තනතුර සඳහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව 09 ක් වුවද තත්‍ය කාර්යය මණ්ඩලය 11 ක් වූයෙන් අනුමත කළ සේවක සංඛ්‍යාව ඉක්මවා නියෝජ්‍ය තැපැල්පති තනතුරු 02 ක් සඳහා බඳවාගෙන තිබුණි.භාණ්ඩාගාරයෙන් අනුමත කළ නියෝජ්‍ය තැපැල්පති තනතුර 2020 ජනවාරි 09 දින වන විට සම්පූර්ණ වී තිබියදී කිසිඳු අනුමැතියක් ලබා නොගෙන 2021 දෙසැම්බර් 11 සහ 2022 අප්‍රේල් 27 දිනවල දෙපාර්තමේන්තුගත නියෝජ්‍ය තැපැල්පති තනතුරුවලට නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු වලට සුදුසුකම් ලත් නිලධාරින් අයදුම් නොකල බැවින් එම තනතුරු 02 සඳහා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් නිලධාරින් යෙදවීමට සිදු විය. ඒ අනුව තනතුර සංඛ්‍යාව 11 ක් වී ඇති බව පෙන්වා දෙමි. | භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ සේවක සංඛ්‍යාව අනුව බඳවාගැනීම් කළ යුතුය. |